**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2018**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව මෙම වාර්තාවෙන් දැක්වේ.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩල වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | රු. 25,000 වැඩි ගෙවීම් සඳහා රු. 25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතු වුවද අවස්ථා 10 කදී රු.1,646,130 ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොතිබුණි. | පැහැදිලි පිලිතුරක්දී නොමැත. | මුද්දර බදු පනත හා ගැසට් පත්‍රයට අනුව කටයුතු කල යුතුයි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 104 හා 105 | 2018 වර්ෂයේ අවස්ථා 05 කදී අධිකාරියේ වාහන වලට අනතුරු සිදුවී තිබුණද ඒ සම්බන්ධයෙන් මු.රෙ. 104 හා 105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ අනුව කටයුතු කිරීමට සුදුසු නිලධාරීන් නොසිටි හෙයින් කටයුතු කිරීමට නොහැකි විය.මෙම වසරේ ක්‍රියාවලිය නිවරැදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳව වාර්තා කිරීම සඳහා හානි පාඩු ලේඛණයක් පවත්වා ගත යුතු වුවත් ඒ අනුව අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (iii) මුදල් රෙගුලාසි 395(ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත් අධිකාරිය විසින් 2018 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බැංකු සැසඳුම් පිළියෙල කර අවසන් කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (iv) මුදල් රෙගුලාසි 507 හා 756 | දෙසැම්බර් මස 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 හා 2018 වර්ෂ සඳහා මෙම වාර්තාවේ දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |

## 2.2 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ලබාදුන් අත්තිකාරම් මුදල ඉක්මවා වියදම් කල අවස්ථා 24 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු. 123,064 ක් විය. මින් අවස්ථා 19 ක දී රු. 1,000 සිට රු. 29,860 ක් දක්වා වූ ප්‍රමාණයක් වැඩියෙන් වියදම් කර තිබුණි. | අත්තිකාරම් මුදලට වඩා වැඩියෙන් වියදම් දැරීම සිදු නොකරන ලෙස උපදෙස් දී ඇත. | ලබා ගත් අත්තිකාරම් මුදල් සීමාව තුල වියදම් කල යුතුයි. |
| (ආ) | ලබාදුන් අත්තිකාරම් මුදලෙන් සියයට 30 වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරි වූ අවස්ථා 22 ක් නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු. 414,211 ක් විය. මෙය ප්‍රතිශතයක් වශයෙන් නිකුත් කල අත්තිකාරම් මුදල් ප්‍රමාණයෙන් සියයට 40 ක් විය. | මෙම මුදල් ලබාදීම සිදු කර ඇත්තේ අත්තිකාරම් මුදලක් වශයෙන් බැවින් සමහර අවස්ථාවලදී ලබාදී ඇති අත්තිකාරම් මුදල් ඉතිරි වීම සිදුවේ. ආයතන විසින් අත්තිකාරම් ලබාගන්නා පුද්ගලයින්ට හා අත්තිකාරම් ලබාදෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට දන්වා ඇත්තේ අවශ්‍ය මුදල් ප්‍රමාණය සඳහාම අත්තිකාරම් ලබා ගන්නා ලෙසය. තවද මෙම තත්වය පාලනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | අවශ්‍ය මුදල් ප්‍රමාණය සඳහාම පමණක් අත්තිකාරම් ලබා දිය යුතුයි. |
| (ඇ) | මු.රෙ. 371 ප්‍රකාරව නිලධාරියෙකුට ලබාදුන් අත්තිකාරමක් දෙන ලද කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවද, අවස්ථා 14 කදී මුළු වටිනාකම රු. 135,318 ක් වූ අත්තිකාරම්, අත්තිකාරම් අවශ්‍ය දිනට සැලකිය යුතු දින ගණනකට පෙර ලබාදී තිබූ අතර, අවස්ථා 27 කදී මුළු වටිනාකම රු. 377,818 ක් වූ අත්තිකාරම් මාස 1 ½ සිට මාස 03 ක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල අත්තිකාරම් ඉල්ලීම කර මුදල් ලැබුණු පසු එම අදාල වැඩසටහන ඔවුන් ක්‍රියාත්මක කරනු ලබයි. එයට හේතුව වශයෙන් ඔවුන් සඳහන් කරන්නේ යම් හෙයකින් මුදල් නොලැබුනහොත් ඔවුන් සතුව ඇති මුදල්ද වැඩසටහන් සඳහා ඇති මුදල් බැවින් එම මුදල් වලින් වෙනත් වැඩසටහන් කිරීමට නොහැකි නිසාය. මේ නිසා අත්තිකාරම් මුදල් කලින් ලබා ගැනීම සිදුකරයි. තවද අත්තිකාරම් මුදල් අදාල වැඩසටහන් ක්‍රියාත්මක කර දින 14 ඇතුලත හෝ ඊට පෙර | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | අත්තිකාරම් මුදල් පියවන ලෙස දැනුම් දී ඇත. තවද වැඩසටහන නියමිත දිනට සතියකට කලින් අත්තිකාරම් මුදල් ලබාගන්නා ලෙස දන්වා ඇති අතර මෙම තත්වය පාලනය කිරීමට සෑම ක්‍රියාමාර්ගයක්ම අනුගමනය කර ඇත. | |
| (ඇ) | අත්තිකාරම් වශයෙන් 2016 වර්ෂයේදී අවස්ථා 33 කදී ලබා දී තිබූ රු.10,269,812 ක් ද, 2017 වර්ෂයේදී අවස්ථා 344 කදී ලබා දී තිබුණු රු.101,985,806 ක් ද, 2018 වර්ෂයේදී අවස්ථා 382 කදී ලබා දී තිබුණු රු. 8,772,256 ක් ද, 2019 දෙසැම්බර් 05 දින වන විටත් පියවා නොතිබුණි. | 2016,2017 හා 2018 වර්ෂ වලදී විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වූ බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාවලින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් මෙම මුදල් පියවීමට අදාල බිල්පත් එවා නොමැති අතර (ඔවුන් වැඩසටහන් සිදු කර ඇත) ඒ සඳහා අප ආයතනයේ නිලධාරීන් ලවා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගොස් එම අදාල බිල්පත් ලබා ගෙන අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර මේ දක්වා සැලකිය යුතු අත්තිකාරම් ප්‍රමාණයක් පියවා ඇත. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2017 අගෝස්තු මස සේවය හැරගොස් ඇති නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 233,731 ණය ශේෂය අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල ඉඩකඩ කුලියට ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමක් 2017 ඔක්තෝබර් 02 දින පල කිරීම සඳහා 2017 වර්ෂයේ රු. 49,507 ක් වැයකර තිබුණු අතර එම දැන්වීමට අදාල ලංසු භාරගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීම සඳහා නැවත රු. 48,300 ක් වැයකර තිබුණු නමුත් පසුව අමාත්‍යාංශ කාර්යාල ගොඩනැගිල්ලේම කාර්යාලය පවත්වා ගැනීමට උපදෙස් ලැබීම නිසා ඒ සඳහා දරන ලද රු. 97,807 ක වියදම අනාර්ථික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | කාර්යාල ඉඩ ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමක් 2017 ඔක්තෝබර් මස පල කලද ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් ලංසු භාර ගැනීමේ දිනය දීර්ඝ කිරීමට සිදුවිය. නමුත් එම දැන්වීමට ලද ලංසු නියමිත පරිදි ලබා නොදීම නිසාත් හා මෙම පරිශ්‍රයේම අප කාර්යාලය පවත්වාගෙන යන ලෙස අමාත්‍යාංශයෙන් උපදෙස් ලද නිසාත් නව කාර්යාල පරිශ්‍රය ලබාගැනීම නවතන ලදී. | නිසි සැලසුමක් අනුව කටයුතු කල යුතුය. |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 32 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් විය. පුරප්පාඩු 13 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අධිකාරියේ රියදුරෙකු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර ඔහුට 2018 මැයි මස දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 191,624 ක්ද අතිකාල හා ගමන් වියදම් ලෙස රු. 52,901 ක් ද වශයෙන් අධිකාරිය විසින් ගෙවා තිබුණි. තවද අධිකාරිය විසින් ඉල්ලීම් කර තිබුණද, අමාත්‍යාංශය විසින් එම වියදම් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | පිළිගනිමු | අමාත්‍යාංශයෙන් එම වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුරු 02ක් හා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීමට 2017 සැප්තැම්බර් මස පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු. 163,760 ක් හා ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුර 02 ක් හා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු 08 ක් සඳහා බඳවා ගැනීමට 2018 සැප්තැම්බර් මස පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා රු. 178,106 ක් ද සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩු පිරවීම සඳහා 2018 ජුනි මස රු. 137,856 ක් ද වැයකර පුවත්පත් දැන්වීම් පලකර තිබුණද එම තනතුරු සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුරු 02 ක් හා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීමට පලමුව විභාග දෙපාර්තමේන්තුව හරහා තරහකාරී විභාගයක් පැවැත්වීමට සැලසුම් කලද එවකට විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය බහුලත්වය නිසා හා එහි විභාග පැවැත්වීමේ ක්‍රමවේදයේ ඇති සංකීර්ණ භාවය නිසා විභාගය පැවැත්වීම ප්‍රමාද විය. එනිසා තරහකාරී විභාගයක් නොපවත්වා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.මේ සඳහා නැවත 2018/09/27 දින පුවත්පත් දැන්වීමක් හරහා අයදුම්පත් කැඳවන ලදී.<br>සහකාර අධ්‍යක්ෂ තනතුරු 01 ක් කළමනාකරණ සහකාර තනතුරු 01 ක් කාර්යාල කාර්යය සහකාර තනතුරු 01 ක් සඳහා පිළිවෙලින් පුවත් පත් දැන්වීම් හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් අයදුම් පත් කැඳවීමට කටයුතු කලද වර්ෂය අවසානයේ පැවති දේශපාලන තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීම් සියල්ල නතර කිරීමට සිදුවිය. | අනුමත බඳවා ගැනීම් පරිපාටියට අනුව බඳවා ගැනීම් සිදු කල යුතුය. |

## 3. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ පහත අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි 2018 වර්ෂයේදීද අවධානය යොමු කර නොතිබුණි. | | |
| ▪ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොළ වෙත යොමු කිරීම හා වෙළඳපොළ ජයග්‍රහණය සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.විශේෂයෙන් නව නිෂ්පාදන ඇති කිරීම මෙන්ම නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා අගය එකතු කිරීම පිණිස පුහුණුව මෙන්ම මහපෙන්වීම අධිකාරිය මඟින් සිදු කරනු ලබයි.මේ තුලින් දේශීය නිෂ්පාදකයින් විදෙස් වෙළඳපොළ ජයග්‍රහණය කර ඇති අතර මෙම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමටද ලක්ව ඇත. | පනතෙහි අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| ▪ තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම. | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් තුල නිෂ්පාදන සංවර්ධන ප්‍රවර්ධනය හා පේටන්ට් අයිතිය සඳහා මහපෙන්වීම සඳහා වූ පහසුකම් අධිකාරිය මඟින් සලසා ඇති අතර අවශ්‍ය | පනතෙහි අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | තාක්ෂණික දැනුමද පුහුණු වැඩසටහන් හරහා ලබාදෙයි. මෙම තාක්ෂණික සංවර්ධන වැඩසටහන් තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කලද මේ සඳහා මේ වන විටත් අනුමැතිය ලබාදී නොමැත. එහෙයින් මෙම අරමුදල පිහිටුවීම සඳහා වූ මූලික ධනය ලබාගැනීමට හැකියාවක් ලැබී නොමැත. | |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි විය. | | |
| (i) ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට තොරතුරු ලබාදීම සඳහා ව්‍යාපාර සංවර්ධන සේවා නාමාවලියක් පිළියෙල කිරීමට සැලැසුම් කර ඒ සඳහා රු. 500,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට දරන ලද වියදම රු. 570,000 ක් විය. එහෙත් එම නාමාවලිය මුද්‍රණය කර තිබුණද 2019 දෙසැම්බර් 05 දින වන විටත් බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේදී සැලසුම් කල ව්‍යාපාර සංවර්ධන සේවා නාමාවලියෙහි සංශෝධන රැසක් සිදුකරන ලදී. මෙය 2019 වර්ෂයේදී සිංහල හා දෙමළ භාෂාවෙන් පරිවර්තනය කරන ලද අතර මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවේ පිටපත් 5000 ක් මුද්‍රණය කර 2020 වර්ෂයේ මුල් කාර්තුව තුල බෙදාහැරීමට සැලසුම් කර ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 50 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණුව ලබාදීමට රු. 500,000 ක් වෙන්කර තිබුණද ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 27 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණු අතර 2018 වර්ෂය අවසන් වන විට ප්‍රතිපාදන වලින් සියයට 26 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ධාරිතාවය වර්ධනය සඳහා විශේෂයෙන් මානව සම්පත් සංවර්ධනය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සුදුසු වැඩසටහන් සිදු කරනු ලැබේ. 2018 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 50 ක් සඳහා | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | පුහුණුව ලබාදීමට සැලසුම් කර තිබුණි. මෙම පුහුණුව ලබාදීමට පෙර අධිකාරිය මගින් මෙම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමත් ඒවා විශ්ලේෂණය කිරීමත් තුලින් අත්‍යාවශ්‍ය පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගත යුතු වේ. මෙම පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය විය.පසුව 2018 වර්ෂයේදී වැඩසටහන් දෙකක් සැලසුම් කලද තිබූ ඉතිරි කාලය තුල එක් වැඩසටහනක් පමණක් ක්‍රියාත්මක කල අතර ඒ සඳහා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 27 දෙනෙකු සම්බන්ධ විය. | |
| (iii) ව්‍යාපාර ගැටළු විසඳීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පිහිටුවීමට හා රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ප්‍රාදේශීය සංසද පිහිටුවා රැස්වීම් පවත්වා තිබුණු නමුත් 2018 වර්ෂයේ අළුතින් කිසිදු දිස්ත්‍රික් ව්‍යවසාය සංසදයක් පිහිටුවා නොතිබුණු අතර, 2018 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ පමණක් දිස්ත්‍රික් ව්‍යවසාය සංසද රැස්වීම් පවත්වා තිබුණි. | ව්‍යාපාර සඳහා පැන නගින ව්‍යාපාර ගැටළු ප්‍රශ්න විසඳීමේ අරමුණින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ව්‍යාපාරික සංසදයන් ප්‍රාදේශීය ලෙස කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක වෙයි. දිස්ත්‍රික් ව්‍යාපාරික සංසද 14 ක් 2018 වර්ෂය වන විට පිහිටුවා තිබුණි. දිස්ත්‍රික් ව්‍යාපාරික සංසදයේ සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම් දරන අතර සංසදය පිහිටුවීම හා සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා ඔහුගේ දායකත්වය ඉතා වැදගත්ය. සමහර දිස්ත්‍රික් ලේකම්වරුන් මේ සඳහා අකමැත්තක් දරන අතර ඔවුන්ගේ විෂය පථයටද මෙය ඇතුලත් නොවේ. මේ නිසා සමහර දිස්ත්‍රික්ක වල සංසදයන් පිහිටුවීම හා පවත්වා ගෙන යාම අසීරු | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | වී ඇත.බොහෝ සංසදයන්ගේ වියදම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මඟින් පියවා ගන්නා අතර එසේ නොවන දිස්ත්‍රික්කයන්හි වියදම අධිකාරිය මඟින් දරයි. පිහිටුවා ඇති දිස්ත්‍රික්ක 14 හි රැස්වීම් අඛණ්ඩව සිදු කරනු ලබයි. | |
| (iv)ව්‍යවසායකයින් 200 දෙනෙකු සඳහා ඇසුරුම්කරණ තාක්ෂණික පුහුණුව ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 850,000 ක් වෙන්කර තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට මාතර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ව්‍යවසායකයින් 90 දෙනෙකු සඳහා පමණක් පුහුණුව ලබාදී තිබුණු අතර ඒ සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 41 ක් වැයකර තිබුණි. | 2018 වර්ෂයේදී ව්‍යාපාරිකයින්ගේ ඇසුරුම්කරණ පුහුණුව දිස්ත්‍රික් පහක ප්‍රතිලාභීන් 200 සඳහා ලබාදීමට සැලසුම් කර තිබුණු නමුත් ඉන් දිස්ත්‍රික්ක දෙකකට පමණක් සීමා වූ අතර ප්‍රතිලාභීන් 90 ක් විය.මෙම පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා ඇසුරුම්කරණ ආයතනය මඟින් සිදු කරන ලදී. නමුත් වර්ෂය අවසානයේදී මෙම ආයතනය මඟින් සම්පත් දායක මහතුන් ලබාගැනීමට අසීරු වූ අතර එම නිසා මෙම වැඩසටහන් සිදුකිරීමට අධිකාරියට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (v) උපාධිධාරී ව්‍යවසායක උදානය යටතේ උපාධිධාරීන් 150 ක් පුහුණු කිරීමට හා 25 ක් සඳහා මූල්‍ය අධාර ලබාදීමට සැලසුම් කර රු. මිලියන 4.5 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද උපාධිධාරීන් 205 ක් පුහුණු කර 13 ක් සඳහා පමණක් රු. 1,825,000 ක් මූල්‍යාධාර ලෙස ලබාදී තිබුණි. | උපාධිධාරී ව්‍යවසායක උදානය යටතේ උපාධිධාරීන් 150 ක් පුහුණු කිරීමට හා 25 ක් සඳහා මූල්‍ය ආධාර ලබාදීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂයේදී උපාධිධාරීන් 205 ක් සඳහා පුහුණුව ලබාදුන් අතර මූල්‍ය අධාර ලබාදීමට 25 ක් හඳුනා ගන්නා ලදී. නමුත් අධිකාරියට එම වර්ෂයේදී ලැබුණු මුදල් ප්‍රතිපාදන මත 2018 වර්ෂයේදී 13 දෙනෙකුට | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | පමණ මුල්‍ය ආධාර ලබාදීමට හැකි විය.ඉතිරි උපාධිධාරීන් සඳහා 2019 වර්ෂයේදී මුල්‍ය ආධාර ලබා දෙන ලදී.මෙම වැඩසටහන සඳහා වෙන් කර තිබුනේ රුපියල් මිලියන 4.5 ක්පමණි. | |
| (vi)2018 වර්ෂයේදී ISO සහතිකය ලබාගැනීම සඳහා රු.200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අධිකාරියේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සවිමත් කිරීම සඳහා උපදේශකයෙකුගේ සේවය ලබාගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පමණක් පලකර තිබුණි. ISO සහතිකය ලබාගැනීම සඳහා 2016 වර්ෂයේ රු. 71,262 ක් ද 2017 වර්ෂයේ රු. 125,000 ක් ද 2018 වර්ෂයේ රු. 35,880 ක් ද වශයෙන් එකතුව රු. 232,142 ක් වැයකර තිබුණද, 2018 වර්ෂය අවසන් වන විටත් ISO සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ISO-9011-2015 තත්ත්ව සහතිකය ලබා ගැනීමේ අරමුණින් අධිකාරිය විසින් අවශ්‍ය කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කර රු.71,262 ක මුදලක් දරා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් ISO තත්ත්ව සහතිකය පිළිබඳ උපදේශකවරයකු තෝරා පත්කර ගැනීමට පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. 2017 වර්ෂයේදී උපදේශක ආයතනයක් තෝරා ගෙන උපදේශක කාර්යයෙන් 70% ක කොටසක් සම්පූර්ණ වූ බැවින් ගෙවීමට අදාල රු.250,000 න් 50% ක් වන රු.125,000 ක් ගෙවන ලදී.නමුත් ආයතනයේ තිබු ගැටළු හේතුවෙන් මෙම ක්‍රියාවලිය 2017 වර්ෂයේදී තාවකාලිකව නතර කරන ලදී. එහෙත් ISO සහතිකය අධිකාරියට ලබා ගැනීමට තිබූ දැඩි අවශ්‍යතාවය නිසා 2018 වර්ෂයේදී නව උපදේශකයකු තෝරා පත් කර ගැනීමට රු.16,560 ක් වැය කරමින් දිනමිණ පුවත්පතේද, රු.19,320 ක් වැය කරමින් ඩේලි නිවුස් පුවත් පතේද දැන්වීමක් පල කරන ලදී. නමුත් ආයතනයේ අවසන් ගිණුම් හා වාර්ෂික වාර්තා | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පිළියෙල කර නොතිබූ නිසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ISO සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය 2018 වර්ෂයේ තාවකාලිකව අත්හිටුවන ලදී. | |
| (vii) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද තරුණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත රු. මිලියන 5.7 ක් වෙන්කර තිබුණි. 2018 වර්ෂයේ අගෝස්තු මාසයේදී අමාත්‍යාංශය විසින් එම වැඩසටහන සඳහා රු. මිලියන 1.14 ක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. මෙම වැඩසටහන සඳහා එක් දිස්ත්‍රික්කයකින් වෘත්තීය පුහුණුලාභීන් 25 දෙනෙකු බැගින් දිස්ත්‍රික් 09 කින් 225 දෙනෙකු පුහුණු කිරීමට හා 180 දෙනෙකු සඳහා රු. 100,000 බැගින් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂය තුල මෙම වැඩසටහන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කල යුතුව පැවතුණද 2018 වර්ෂය අවසන් වන විට බස්නාහිර පලාතේ ප්‍රතිලාභීන් 100 දෙනෙකු හඳුනාගෙන ව්‍යාපාර සැලසුම් සැකසීමේ දින 02 ක පුහුණුවක් පමණක් ලබා දී තිබුණි. මෙම වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් වර්ෂය අවසන් වන විට රු. 678,914 ක් පමණක් වැයකර තිබුණි. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මට අනුව තරුණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා රු. මිලියන 5.7 ක් වෙන්කර තිබුණි. එයින් අත්තිකාරම් වශයෙන් රු. මිලියන 1.14 ක් අධිකාරිය වෙත ලබාදී තිබුණි. මෙම වැඩසටහන තුලින් බස්නාහිර පළාතේ වෘත්තීය පුහුණුලාභීන් 100 ක් සඳහා අවශ්‍ය ව්‍යවසාය සංවර්ධන පුහුණුව ලබාදීමටත් ඉන් පසු උපකරණ ලබාදීමත් ඉලක්ක කර තිබුණි. අධිකාරියේ වෘත්තීය පුහුණුලාභීන් සම්බන්ධ කර ගනිමින් බස්නාහිර පළාතේ වෘත්තීය පුහුණුලාභීන්ගෙන් ඉල්ලුම්පත් ලබා ගත් අතර ඉන් 100 දෙනෙකු තෝරාගන්නා ලදී.මේ සඳහා අධිකාරියට වැඩි කලක් ගත කිරීමට සිදුවිය.මෙසේ තෝරා ගත් 100 දෙනා සඳහා අවශ්‍ය ව්‍යවසාය සංවර්ධන පුහුණුව ලබා දෙන ලදී.පසුව ප්‍රමාණවත් කාලයක් නොමැති හෙයින් රූපලාවන්‍ය අංශය පමණක් තෝරා ගෙන ප්‍රතිලාභීන් 28 දෙනෙකු සඳහා යන්ත්‍ර උපකරණ ලබාගැනීමට කටයුතු කර ඒවා මිලදී ගන්නා ලදී.මෙම වැඩසටහන | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2018 වර්ෂයේ රු.මිලියන 1.49 ක් වැය කරන ලදී. 2019 වර්ෂයේ අදාල ප්‍රතිලාභීන්ට උපකරණ බෙදා දෙන ලදී. | |
| (viii) | Know how ව්‍යාපෘතිය යටතේ එක් දිස්ත්‍රික්කයකින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් 100 ක් ඉලක්ක කර මෙහි පළමු අදියර යටතේ බදුකරණය, බදුකරණ ක්‍රියාවලිය, කම්කරු සම්බන්ධ නීති හා රීති සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ සේවා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම්කර 2018 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 7 ක් වෙන්කර තිබුණි. එහෙත් දිස්ත්‍රික් 14 ක පමණක් එම වැඩසටහන පවත්වා තිබුණු අතර ඉන් දිස්ත්‍රික්ක 06 කින්ම එම වැඩසටහන සඳහා සහභාගි වී තිබුණේ ව්‍යවසායකයින් 373 ක් පමණි. 2018 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් පමණක් වැයකර තිබුණි. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම වැඩසටහන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු. මිලියන 7 ක් වෙන්කර තිබුණි. මේ සඳහා රු. මිලියන 2.187 ක් වියදම් විය. මෙම වැඩසටහන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව සහ පාරිභෝගික සේවා අධිකාරිය සම්බන්ධ කරගෙන ව්‍යාපාරිකයින් හට දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.මෙම වැඩසටහන සඳහා නිර්දේශිත මුදල ලබා ගැනීමට හැකිවූයේ වසර මැද කාලයේදී වූ අතර අධිකාරියට දිස්ත්‍රික්ක 14 ක පමණක් සිදු කිරීමට හැකියාව ලැබුණි. මෙම වැඩසටහන් සඳහා අවශ්‍යතාවය ඇති සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් පමණක් ඉලක්ක කර ගත් හෙයින් සමහර වැඩසටහන් වල පැමිණීම දුර්වල මට්ටමක පැවතුනද වැඩසටහන් ඉතා සාර්ථකව පැවැත්වූ අතර සහභාගී වූවන් ඉතාමත් ප්‍රසාදයට පත්විය.ඉතිරි දිස්ත්‍රික්ක වල මෙම වැඩසටහන 2019 වර්ෂයේ දී සිදුකරන ලදී. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |